	නිවාස ණය පොලී		1,338,399.70
	කාර්ය මණ්ඩල ප්‍රවාහනය	4,266,439	8,146,582
	විශේෂ දිරි දීමනා	-	23,891,565
	නිවාඩු සඳහා ගෙවීම්	-	23,753,315
	කාර්ය මණ්ඩල සම්මාන	46,750	98,000
		4,313,189	**83,450,427**
14.	**මූල්‍ය ආදායම්**		
	ආපදා ණය සඳහා පොලී ලැබීම්	177,328	452,698
	බැංකු පොලී ලැබීම් - ඉතිරි කිරීම් ගිණුම පොලී	826,376	901,559
	ස්ථිර තැන්පතු සඳහා පොලී ලැබීම්	11,644	625,000
	ලැබිය යුතු ස්ථිර තැන්පතු පොලී	2,948,214	3,786,234
		3,963,563	**1,979,257**

	2022 රු.	2021 රු.
14.1 මූල්‍ය වියදම්		
බැංකු ගාස්තු හා බැංකු ඇපකර ගාස්තු		
බැංකු අයිරා පොලී	3,793,727	1,983,638
බැංකු ණය පොලී - කෙටි කාලීන	8,906,445	4,241,195
බැංකු ණය පොලී - දිගු කාලීන	154,915,633	84,438,970
දඩ මුදල් ගාස්තු	8,227,134	7,169,709
ගෙවිය යුතු පොලී ස්ථාවර තැන්පතු	134,955	-
	2,062,123	-
	178,040,017	**97,833,512**
15. ආදායම් බදු		
වර්ෂය සඳහා ආදායම් බදු වෙන් කිරීම - සටහන 15.1	-	-
	-	-

15.1 ආදායම් බදු ගණනය තක්සේරු වර්ෂය 2022/2023
පදනම - 2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන ගිණුම් වර්ෂය

	රු.
වෙළඳ හෝ ව්‍යාපාරවලින් බදු අයකළ හැකි ලාභය	(373,820,387)
පොලී ආදායම	3,963,563
වෙනත් මූලාශ්‍ර වලින් ලාභය	-
ලිපිද්‍රව්‍ය ආදායම	**(369,856,825)**
අඩුකළා : මුළු ලිපිද්‍රව්‍ය ආදායම් වලින් අඩුකිරීම්	
වෙළඳ ව්‍යාපාර වලින් අඩුකළ හැකි අලාභ	(1,370,334,960)
පොලී, වාරික, බිම් කුලී සහ කතෘ භාගය ගෙවීම්	(78,545)
බදු අයකළ හැකි ආදායම	**(1,740,270,329)**
බදු	-
ආදායම් බදු	-
ගෙවිය යුතු දල බද්ද	-
බෙදාහැරිය හැකි ලාභය මත බද්ද	
ලාභාංශ බද්ද	
ගෙවිය යුතු මුළු බද්ද	-
බදු බැර	
ආර්ථික සේවා ගාස්තු	-
ගෙවිය යුතු බදු ශේෂය	-

15.2 ඉදිරියට ගෙන ආ අඩු කල හැකි බදු අලාභ පෙර වර්ෂ 4න්	
2018/2019 වර්ෂයේ ඉදිරියට ගෙන ආ අලාභයන්	816,822,514
2019/20 වර්ෂයේ ඉදිරියට ගෙන ආ අලාභයන්	135,824,993
2020/21 වර්ෂයේ ඉදිරියට ගෙන ආ අලාභයන්	43,867,066
2021/22 වර්ෂයේ ජනිත වූ අලාභයන්	373,820,387
2022 වර්ෂයේ ඉදිරියට ගෙන ආ අලාභ ශේෂයන්	**1,370,334,960**

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

16. දේපළ, පිරියත සහ උපකරණ

විස්තරය	ප්‍රත්‍යාගණනය 01. 01. 2021	භාණ්ඩාගාර ප්‍රධානයන් යන්තු අත්පත්කර ගැනීම සඳහා	ප්‍රත්‍යාගණන/ පිරිවැය 31. 12. 2021	2021 වර්ෂය තුළ ඉවත් කිරීම්	පිරිවැය/ ප්‍රත්‍යාගණනය 31. 12. 2021	2022 වර්ෂය තුළ එකතු කිරීම්	භාණ්ඩාගාර ප්‍රධානයන් යන්තු අත්පත්කර ගැනීම සඳහා	2022 වර්ෂය තුළ ඉවත් කිරීම්	2022. 12. 31 දිනට ශේෂය
පිරිවැයට									
ඉඩම්	378,500,000	-	-	107,000,000	271,500,000	-			271,500,000
ගොඩනැගිලි	166,600,000	-	-	-	166,600,000	-		-	166,600,000
පිරියත හා යන්ත්‍රෝපකරණ	552,111,174	217,382,421	28,866,670	-	798,360,265	6,861,441	197,580,734	-	1,002,802,440
මෝටර් හා වෙනත් වාහන	55,563,000	-	-	-	55,563,000	-		-	55,563,000
කාර්යාලයීය උපකරණ	14,531,241	-	1,705,783	-	16,237,024	5,045,496		-	21,282,520
පරිගණක හා උපාංග	6,618,724	-	5,620,011	-	12,238,735	1,041,490		-	13,280,225
ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන	2,572,951	-	-	-	2,572,951	-		-	2,572,951
එකතුව	**1,176,497,090**	**217,382,421**	**36,192,464**	**107,000,000**	**1,323,071,975**	**12,948,427**	**197,580,734**	**-**	**1,533,601,136**
සමුච්චිත ක්ෂය වීම්									
විස්තරය	**ප්‍රත්‍යාගණනය 01. 01. 2021**		**වර්ෂය තුළ ඉවත් කිරීම්**	**සමුච්චිත ක්ෂයවීම් 31.12.2021**	**වර්ෂය තුළ ඉවත් කිරීම්**	**පිරිවැය / ප්‍රත්‍යාගණනය 01.01.2022**		**වර්ෂය තුළ ක්ෂයවීම් 2022**	**සමුච්චිත ක්ෂයවීම් 31.12.2022**
ගොඩනැගිලි	16,660,000		4,165,000	-	20,825,000	4,165,000		0.00	24,990,000
පිරියත හා යන්ත්‍රෝපකරණ	146,439,092		9,332,990	-	195,772,082	65,193,524		0.00	260,965,606
මෝටර් රථ හා මෝටර් සයිකල්	55,562,976		-	-	55,562,976	0		0.00	55,562,976
කාර්යාලයීය උපකරණ හා ලී බඩු	4,408,634		1,516,681	-	5,925,315	1,857,792		0.00	7,783,107
පරිගණක හා උපාංග	5,799,188		1,186,537	-	6,985,725	1,928,558		0.00	8,914,283
ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන	2,572,950		-	-	2,572,950	0		0.00	2,572,950
එකතුව	**231,442,839**		**56,201,209**	**-**	**287,644,047**	**73,144,874**		**-**	**360,788,921**
ලියා හල අගය						**1,035,427,928**			**1,172,812,215**

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වයට අදාළ සටහන්

	2022 රු.	2021 රු.
17. තොගය		
අමුද්‍රව්‍ය	102,230,178	92,745,990
පාරිභෝගික භාණ්ඩ	9,055,094	8,423,058
අමතර කොටස්	49,524,755	39,956,646
ලෝහ භාණ්ඩ / ගොඩනැගිලි ද්‍රව්‍ය	2,167,511	1,288,618
නිමි තොගය	11,075,844	115,057,362
නොනිමි තොගය	22,024,569	70,399,790
එකතුව	**196,077,951**	**327,871,465**
18. වෙළඳ ලැබිය යුතු ශේෂය		
වෙළඳ ණයගැතියෝ	249,599,596	752,068,839
අඩමාණ ණය සඳහා වෙන් කිරීම්	(69,606,839)	(64,560,453)
අ.ප්‍ර.දෙ. තත්ත්ව හානි/දඩ වෙන්කිරීම්	0	(9,343,150)
වෙනත් ණයගැතියෝ	361,309	361,309
	180,354,066	**678,526,544**
19. වෙනත් ලැබිය යුතු ශේෂය		
සේවක ණය හා අත්තිකාරම් (සටහන 19.1)	5,546,041	5,016,011
තැන්පතු හා ලැබීම් (සටහන 19.2)	12,744,125	7,504,278
විකුණුම් පාලන ගිණුම (සටහන 19.3)	119,298	(2,526,947)
බැංකු ණය - තීරු/ආන්තික ගිණුම - ජාත්‍යන්තර	0	14,533,440
	18,409,464	**24,526,782**
19.1 ණය හා අත්තිකාරම්		
ආපදා ණය	1,122,764	1,998,612
උත්සව අත්තිකාරම්	1,702,000	1,886,000
සේවක වැටුප් අත්තිකාරම්	10,000	56,000
ණය හිමි අත්තිකාරම් ගිණුම	2,711,278	1,075,399
	5,546,042	**5,016,011**
19.2 තැන්පතු හා ලැබීම්		
තැන්පතු සඳහා ලැබීම්	12,234,388	6,939,202
අමතර වෙනත් ලැබීම්	509,737	565,075
	12,744,125	**7,504,278**
19.3 විකුණුම් පාලන ගිණුම		
විකුණුම් පාලන ගිණුම	119,298	(2,526,947)
	119,298	**(2,526,947)**
20. මුදල් හා මුදල්වලට සමාන දෑ		
බැංකුවේ ඇති මුදල්	16,606,664	32,362,664
මාර්ගස්ථ මුදල්	381,998	2,615,326
අතැති මුදල්	27,000	27,000
	17,015,662	**35,004,991**
මුදල් ගලා ඒම, මුදල් සහ මුදල් හා සමාන ප්‍රකාශනය සඳහා වන තොරතුරු පහත පරිදි වේ.		
බැංකුවේ ඇති මුදල්	16,606,664	32,362,664
මාර්ගස්ථ මුදල්	381,998	2,615,326
අතැති මුදල්	27,000	27,000
	17,015,662	**35,004,991**
බැංකු අයිරා	(41,090,093)	(36,975,695)
	(24,074,431)	**(1,970,704)**

	2022 රු.	2021 රු.
21. වෙළඳ ගෙවිය යුතු ශේෂයන්		
වෙළඳ ණය හිමියන්	212,083,210	463,229,261
වෙනත් ණය හිමියන් පුරස්කර, නියෝජනය, වෙනත්	1,775,244	1,696,699
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (22.1)	234,109,923	200,195,314
විකුණුම් අත්තිකාරම්	-	17,584
වෙනත් ණය හිමියන් (හර ශේෂය)	1,279,659	1,279,659
	449,248,036	**666,418,516**
22. වෙනත් ගෙවිය යුතු ශේෂයන්		
උපචිත වියදම්	63,191,013	77,088,193
තැන්පතු ගෙවීම්	1,337,463	2,212,962
	64,528,476	**79,301,155**
22.1 ගෙවිය යුතු - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ආර්ථික සේවා ගාස්තු	23,342,409	23,342,409
එකතු කළ අගය මත බදු	124,642,025	90,727,416
ජාතික ආරක්ෂක බදු	80,840,239	80,840,239
ආදායම් බදු	5,000,000	5,000,000
රඳවා ගැනීමේ බදු	158,950	158,950
රඳවා ගැනීමේ බදු - 10% ගෙවිය යුතු	126,300	126,300
	234,109,923	**200,195,314**

කාරක ගිණුම (ප්‍රධාන මුද්‍රණාලය) 2022. 01. 01. සිට 2022. 12. 31 දක්වා කාලසීමාව තුළ

			2022.12.31 දක්වා රු.	2021.12.31 දක්වා රු.
23.	(1)	මුද්‍රණ ආදායම		
	(1.1)	පෙළපොත්	41,569,625	1,186,918,385
	(1.2)	ලොතරැයි මුද්‍රණය (ජා.ලෝ.ම.)	-	247,229,602
	(1.3)	ජොබ් වැඩ (වාණිජ මුද්‍රණ කටයුතු)	151,078,705	53,795,367
	(1)	**මුළු ආදායම්**	**192,648,330**	**1,487,943,354**
		ආදායම් අඩු කළ ගාස්තු		
	(1.1.1)	ප්‍රමාද ගෙවීම්/තත්ව හානි හා දඩ (අ.ප්‍ර.දෙ.)	2,135,021	410,261
	(1.1.2)	අ.ප්‍ර.දෙ. ප්‍රමාද ගාස්තු/තත්ව හානි සඳහා වෙන්කිරීම්	-	9,343,150
	(1.1.3)	ප්‍රමාද ගෙවීම් (ජා.ලෝ.ම.)	-	3,177,350
	(1.1)	**මුළු ආදායමෙන් අඩු කළ ගාස්තු**	**2,135,021**	**12,930,761**
	(1.2)	**ලැබිය යුතු මුළු ආදායම (1 - 1.1)**	**190,513,309**	**1,475,012,593**
	(2)	කර්මාන්තශාලා වියදම් (සෘජු)		
	(2.1)	අමු ද්‍රව්‍ය පරිභෝජනය	**58,958,987**	**896,611,944**
		ශ්‍රමය - සෘජු		
		වැටුප් හා වේතන	109,387,477	136,686,216
		අතිකාල දීමනා	6,489,018	26,422,438
		කෑලි ගණනට වැඩ කිරීම්	5,200,992	41,393,869
		සේවක අර්ථසාධක අරමුදල	14,247,829	17,491,529
		සේවක භාරකාර අරමුදල	3,405,613	4,372,884
		දිරි දීමනා	1,175,260	2,067,750
		ආහාර දීමනා / සේවක සුභසාධනය	5,350,662	7,291,030
		සේවක වෛද්‍යාධාර ක්‍රමය	3,492,890	-
		සේවක නිවාස ණය පොලී	597,277	-
	(2.2)	**මුළු සෘජු ශ්‍රමය**	**149,347,018**	**235,725,716**
		වෙනත් කර්මාන්තශාලා වියදම - සෘජු		
		පරිභෝජන ද්‍රව්‍ය පරිභෝජනය	4,758,418	16,397,134
		අමතර කොටස් පරිභෝජනය	1,819,573	18,156,203
		ද්‍රව්‍ය පරිභෝජනය	4,961,153	3,583,469
		විදුලිය සෘජු	7,525,282	11,805,644
	(2.3)	**සෘජු වෙනත් කර්මාන්ත ශාලා වියදම්**	**19,064,426**	**49,942,450**
	(2)	**සෘජු වියදම් [2.1 + 2.2 + 2.3]**	**227,370,431**	**1,182,280,110**
	(3)	කර්මාන්තශාලා වියදම් (වක්‍ර)		
		වැටුප් හා වේතන	24,913,387	26,962,760
		අතිකාල දීමනා	7,833,191	12,517,259
		සේවක අර්ථසාධක අරමුදල	3,042,950	3,381,118
		සේවක භාරකාර අරමුදල	917,081	845,267
		දිරි දීමනා	275,750	405,000
		ආහාර දීමනා / සේවක සුභසාධනය	1,264,412	-
		යන්ත්‍රෝපකරණ හා නඩත්තු	4,406,246	11,912,768
		බාහිර මුද්‍රණ වැඩ	365,287	2,729,738

		2022.12.31 දක්වා රු.	2021.12.31 දක්වා රු.
	බාකෝර්ඩින් පද්ධතිය නඩත්තුව හා නවීකරණය කිරීම	-	13,748,685
	විදුලිය	836,142	1,311,738
	සේවක රක්ෂණය	114,932	
	ගිනි රක්ෂණය	490,816	747,839
	සාම්පල හා කඩදාසි පරීක්ෂා කිරීමේ ගාස්තු	7,165	209,845
	යන්ත්‍ර කුලියට ගැනීමේ වියදම්	636,938	579,337
	නැවත නොගෙවන ප්‍රසම්පාදන තැන්පතු	90,000	-
	රථ වාහන නඩත්තු		
	අලුත්වැඩියාවන්	2,499,204	2,340,621
	ඉන්ධන සහ තෙල්	4,967,023	1,544,775
	රක්ෂණය	665,983	550,539
	අඩු කළා :-		
	20% ක් ලාභාලාභ ගිණුමේ පරිපාලන වියදම්	(1,626,442)	(1,108,984)
	20% ක් විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්	(1,626,442)	(1,108,984)
	20% ක් ලිපිද්‍රව්‍ය කම්හලේ කාරක ගිණුම සඳහා	(1,626,442)	(1,108,984)
	20% ක් සුරක්ෂා මුද්‍රණ කාරක ගිණුම සඳහා	(1,626,442)	-
	ක්ෂය කිරීම		
	ගොඩනැගිලි (2/3 ප්‍රධාන මුද්‍රණාලය)	2,505,000	3,757,500
	යන්ත්‍රෝපකරණ	33,615,074	42,807,803
(3)	**මුළු වක්‍ර පිරිවැය**	**82,940,813**	**123,025,642**
(4)	**නිෂ්පාදන පිරිවැය** - තොග රහිත [2 + 3]	**310,311,244**	**1,305,305,752**
	එකතු කළා : ආරම්භක තොගය නොනිමි වැඩ තොගය	50,271,369	17,180,015
	ආරම්භක තොගය නිමි භාණ්ඩ තොගය	2,796,150	2,553
	අඩු කළා : අවසාන තොගය නොනිමි වැඩ තොගය	(19,842,090)	(50,271,369)
	අවසාන තොගය නිමි භාණ්ඩ තොගය	0	(2,796,150)
	අඩු කළා : පරිගණක ලිපිද්‍රව්‍ය අංශයට හුවමාරු කළ අගය	(3,347,218)	(980,335)
	ඉඩදිය නොහැකි යෙදවුම් බද්ද	2,371,770	58,075,736
(5)	**ආරම්භක/අවසාන ගොත ගැලපීම්**	**32,249,981**	**21,210,450**
(6)	**මුළු නිෂ්පාද පිරිවැය** (4+ 5)	**342,561,225**	**1,326,516,202**
(7)	**දළ කාරක ලාභය** [1.2 - 6]	**(152,047,916)**	**148,496,391**

නිෂ්පාදන ගිණුම (සුරක්ෂා මුද්‍රණ) 2022. 01. 01. සිට 2022. 12. 31 දක්වා කාලසීමාව තුළ

		2022.12.31 දක්වා රු.
24.	මුද්‍රණ ආදායම	
(1)	ලොතරැයි මුද්‍රණය (ජා.ලොෙ.ම.)	405,863,648
(1.1)	මුද්‍රණ දෝෂ සඳහා අය කිරීම සඳහ ජා.ලොෙ.ම. අඩු කිරීම	20,468,587
(1.1.1)	**ලැබිය යුතු මුළු ආදායම (1 - 1.1)**	**385,395,061**
(2)	කර්මාන්තශාලා වියදම් (සෘජු)	
(2.1)	අමු ද්‍රව්‍ය පරිභෝජනය	**181,161,787**
(2.2)	ශ්‍රමය - සෘජු	
	වැටුප් හා වේතන	35,680,919
	අතිකාල දීමනා	13,026,876
	සේවක අර්ථසාධක අරමුදල	4,240,838
	සේවක භාරකාර අරමුදල	1,060,210
	දිරි දීමනා	348,000
	ආහාර දීමනා / සේවක සුභසාධනය	1,770,195
	සේවක වෛද්‍යාධාර ක්‍රමය	876,980
	සේවක නිවාස ණය පොලී	31,086
(2.2)	**මුළු සෘජු ශ්‍රමය**	**57,035,104**
	වෙනත් කර්මාන්තශාලා වියදම - සෘජු	
	පරිභෝජන ද්‍රව්‍ය පරිභෝජනය	8,867,892
	අමතර කොටස් පරිභෝජනය	2,013,356
	ද්‍රව්‍ය පරිභෝජනය (25% මුළු පිරිවැය)	1,653,718
	විදුලිය සෘජු (1/3 ප්‍රධාන මුද්‍රණාලය)	4,180,712
(2.3)	**සෘජු වෙනත් කර්මාන්ත ශාලා වියදම්**	**16,715,678**
(2)	**එකතුව සෘජු වියදම් [2.+2.2+2.3]**	**254,912,569**
(3)	කර්මාන්තශාලා වියදම් (වක්‍ර)	
	වැටුප් හා වේතන	2,176,117
	අතිකාල දීමනා	174,612
	සේවක අර්ථසාධක අරමුදල	219,339
	සේවක භාරකාර අරමුදල	54,836
	දිරි දීමනා	19,750
	ප්‍රවාහන දීමනා	297,500
	බාහිර ආයතන වල වැඩ	26,083,805
	ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු	124,000
	යන්ත්‍රෝපකරණ නඩත්තුව	65,000
	20% වාහන නඩත්තුව	1,626,442
	බාර්කෝඩින් නඩත්තුව සහ නවීකරණය	5,235,000
	ක්ෂය	
	ගොඩනැගිලි (1/3 ප්‍රධාන මුද්‍රණාලය)	1,252,500
	යන්ත්‍ර / උපකරණ	25,053,263
(3)	**මුළු වක්‍ර වියදම්**	**62,382,164**
(4)	**නිෂ්පාදන වියදම් [2 + 3]**	**317,294,733**
(5)	**දල ලාභය [1.2 - 4]**	**68,100,328**

කාරක ගිණුම (ලිපිද්‍රව්‍ය කර්මාන්ත ශාලාව) 2022. 01. 01. සිට 2022. 12. 31 දක්වා කාලසීමාව තුළ

		2022.12.31 දක්වා රු.	2021.12.31 දක්වා රු.
25.	(1) ලිපිද්‍රව්‍ය විකිණීමෙන් ආදායම	**216,910,849**	**126,407,838**
	(2) කර්මාන්ත ශාලා වියදම් - සෘජු		
	(2.1) මුළු අමුද්‍රව්‍ය පරිභෝජනය	**13,926,204**	**108,197,125**
	(2.2) ශ්‍රමය - සෘජු :		
	සේවක වැටුප් හා වේතන	22,319,896	22,763,052
	අතිකාල දීමනා	2,114,145	6,522,868
	සේවක අර්ථසාධක අරමුදල	2,856,132	3,003,571
	සේවක භාරකාර අරමුදල	714,033	750,893
	දිරි දීමනා	210,750	338,250
	ආහාර දීමනා / සේවක සුභසාධනය	1,289,615	-
	සේවක වෛද්‍යාධාර දීමනා	750,070	-
	සේවක නිවාස ණය පොලී	91,228	-
	ප්‍රවාහන දීමනා	91,000	-
	(2.2) මුළු සෘජු ශ්‍රමය	**30,436,869**	**33,378,634**
	(2.3) කර්මාන්ත ශාලා වියදම් - සෘජු		
	පරිභෝජන ද්‍රව්‍ය පරිභෝජනය	464,795	808,442
	ද්‍රව්‍ය පරිභෝජනය	23,109	1,147,324
	විදුලිය	755,250	1,124,810
	(2.3) මුළු සෘජු කර්මාන්තශාලා වියදම්	**1,243,154**	**3,080,576**
	(2) මුළු සෘජු වියදම් [2 .1+2.2+2.3]	**45,606,227**	**144,656,335**
	(3) කර්මාන්තශාලා වියදම් - වක්‍ර		
	වැටුප් හා වේතන	3,852,473	4,657,275
	අතිකාල දීමනා	169,271	663,553
	සේවක අර්ථසාධක අරමුදල	478,511	620,964
	සේවක භාරකාර අරමුදල	119,628	155,241
	දිරි දීමනා	40,750	57,750
	විදුලිය	83,917	124,979
	ක්ෂය කිරීම		
	ගොඩනැගිලි	407,500	407,500
	යන්ත්‍රෝපකරණ	6,525,188	6,525,188
	(3) කර්මාන්ත ශාලා වියදම් වක්‍ර	**11,677,238**	**13,212,450**
	(4) නිෂ්පාදන පිරිවැය - තොග රහිත [2 + 3]	**57,283,465**	**157,868,785**
	එකතු කළා : ආරම්භක තොගය		
	නොනිමි වැඩ	20,128,421	28,665,234
	නිමි භාණ්ඩ	102,785,342	60,751,160
	අඩු කළා : අවසාන තොගය නොනිමි වැඩ	(2,182,479)	(20,128,421)
	නිමි භාණ්ඩ	(6,406,194)	(102,785,342)
	හානි වූ තොග - වරකාපොල	(602,520)	-
	අඩු කළා ; පරි. මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය ගිණුමට මාරු කළා	(30,575)	(2,624,074)
	ලිපිද්‍රව්‍ය මාරුකළා සේවක සුභසාධන, පරිත්‍යාග හා වෙනත්	1,626,442	1,108,984
	මෝටර් රථ වටිනාකම ප්‍රධාන මුද්‍රණාල කාරක ගිණුමෙන් මාරුකළා 20%	-	(14,341)
	හානි වූ තොග - වරකාපොල - අලාභය	60,252	-
	(5) **ආරම්භක/අවසාන තොග ගැලපීම්**	**115,378,689**	**(35,026,800)**
	(6) එකතුව නිෂ්පාදන පිරිවැය (4 + 5)	**172,662,154**	**122,841,985**
	(7) දළ කාරක ලාභය [1 - 6]	**44,248,695**	**3,565,852**

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

ආදායම් සහ වියදම් ගිණුම (ප්‍රකාශන අංශය) 2022. 01. 01. සිට 2022. 12. 31 දක්වා කාලසීමාව තුළ

			2022.12.31 දක්වා රු.	2021.12.31 දක්වා රු.
26.	(1)	ආදායම්	**798,985**	**640,689**
		අඩු කළා : නිෂ්පාදන පිරිවැය :		
		ආරම්භක තොගය	3,114,875	3,476,962
		එකතු කළා : තොග ඌනතා	-	(923)
		අඩු කළා : අවසාන තොගය	(2,849,885)	(3,114,875)
	(2)	නිෂ්පාදන පිරිවැය	**361,164**	**772,772**
		මාරු කළා, සේවක සුභසාධන, පරිත්‍යාග සහ වෙනත්	(714,191)	
		එකතු කළා : වියදම්		
		වැටුප් හා වේතන	1,594,841	1,800,845
		අතිකාල දීමනා	-	16,539
		සේවක අර්ථසාධක අරමුදල	203,422	226,287
		සේවක භාරකාර අරමුදල	50,856	56,572
		දිරි දීමනා	18,750	23,250
		ආහාර දීමනා / සේවක සුභසාධනය	91,125	-
		සේවක වෛද්‍යාධාර දීමනා	50,110	-
		ප්‍රවාහන දීමනා	16,935	-
		පරිභෝජන දීමනා	-	951
		කර්‍ම භාග	78,545	56,276
		ප්‍රකාශන පරිත්‍යාග	36,270	714,191
		මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය (ප්‍රකාශන)	(14,692)	-
	(3)	මුළු නිෂ්පාදන වියදම්	**2,391,152**	**2,541,885**
	(4)	ආදායමට වඩා වැඩි වී ඇති වියදම	**(1,592,167)**	**(1,901,196)**

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

වෙළඳ ගිණුම (වෙනත් අලෙවි අංශ) 2022. 01. 01. සිට 2022. 12. 31 දක්වා කාලසීමාව තුළ

		2021.12.31 දක්වා රු.	2020.12.31 දක්වා රු.
(1)	ආදායම්	**8,614,495**	**18,355,631**
	අඩු කළා : විකුණුම් පිරිවැය		
	ආරම්භක තොගය	6,360,996	10,603,979
	මිලදී ගැනීම්	1,847,008	11,919,850
	එකතු කළා : තොග ඌනතා / මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	(32,450)	(192,842)
	අඩු කළා : අවසාන තොගය	(1,819,765)	(6,360,996)
	විකුණුම් පිරිවැය	**6,355,789**	**15,969,992**
	දළ ලාභය	**2,258,706**	**2,385,639**

2022 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. CAM/D/SPC/2022/03

මබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 මැයි 31 දින

සභාපති
රාජ්‍ය මුද්‍රණ සංස්ථාව

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්වාගණනය කළ මතය

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ). ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 වන ඡේදය ප්‍රකාරව වත්කමක සුන්බුන් අගය (Residual Value) සහ එහි ඵලදායී ජීවිත කාලය අවම වශයෙන් එක් එක් මූල්‍ය වර්ෂයක් අවසානයේදී සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂා කළ අගයන් හැර ඇස්තමේන්තු අගයන්ගෙන් වෙනස් වේ නම් එම වෙනස්කම් ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස්කමක් ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ගිණුම්ගත කළ යුතු වුවද , මුළුමනින්ම අගය ශූන්‍ය වූ එහෙත් තවදුරටත් භාවිතා කරන එකතුව රු. 64,281,974 ක් වටිනා දේපළ

පිරියත උපකරණ අයිතම 352 ක ඵලදායී ජීවිත කාලය නැවත අගය කර පොත්වලට ගෙන නොතිබුණි.

(ආ). අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවට ලබා දී තිබූ රු.27,951,780 ක විකුණුම් අත්තිකාරම් මුදලක්, ණයගැති ලැබීමක් ලෙස සටහන් කර තිබීම නිසා සංස්ථාවේ ජංගම වත්කම් හා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ). 2021 වර්ෂයේ ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ ලොතරැයි පතක් මුද්‍රණය කර දීම සඳහා ගිවිසුම් ගත මුදල වූ ශත 49 අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සභාපතිවරයා විසින් ශත 44 දක්වා අඩුකිරීමට එකඟවීම නිසා සංස්ථාවට සිදු වූ රු.10,519,265 ක අලාභය, අඩමාණ ණය වෙන් කිරීමක් ලෙස ගලපා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම අලාභය ණය ගැනියන්ගෙන් අඩුකර පෙර වර්ෂයේ ගැලපුමක් ලෙස රඳවාගත් ලාභයෙන් අඩුකර දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ රඳවාගත් අලාභය එම ප්‍රමාණයේන් තවදුරටත් වැඩි වී තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ අඩමාණ ණය වියදම එම ප්‍රමාණයෙන අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතුව සඳහා ගණනය කරන ලද පොළිය රු.3,451,227ක් වුවද, එය ආදායම් ප්‍රකාශනය තුළ රු.2,959,858 ක් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව ස්ථාවර තැන්පතු පොළී ආදායම හා ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය රු.491,369කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ). විකුණුම් පිරිවැය ගණනය කිරීම් සඳහා අදාල නොවන මෙහෙයුම් වියදමක් පදනම් කරගෙන විකුණුම් පිරිවැය ගණනය කිරීම හේතුවෙන් විකුණුම් පිරිවැය රු.20,468,587 කින් අධිතක්සේරු වී ආදායම් ප්‍රකාශනයේ දළ අලාභය එම අගයෙන් වැඩි වී තිබුණි.

(ඊ). මුද්‍රණ සංස්ථාවේ ලෙජරයේ කේවල ගිණුම් ශේෂ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 7 කින් අයවිය යුතු රු.3,210,565 ක් වුවද එම ආයතන විසින් විගණනය වෙත තහවුරු කරන ලද ශේෂයන් තුල අයවිය යුතු ශේෂයන් නොමැති බවට තහවුරු කරන ලදි. ඒ අනුව සංස්ථාවේ අය විය යුතු ශේෂයන් තුල රු.3,210,565 ක වෙනසක් නිරූපණය විය. තවද සංස්ථාවේ කේවල ශේෂ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 7කට ගෙවිය යුතු ශේෂය රු.166,509,372ක් වුවද එම ආයතන විසින් විගණනයට තහවුරු කරන ලද ශේෂයන් හි එකතුව රු.172,728,682 ක් විය. එම නිසා ගෙවිය යුතු ශේෂයන් තුල රු.6,219,310ක වෙනසක් නිරූපනය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. කරුණු අවධාරණය කිරීම

මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 2.3 කෙරෙහි අවධානය යොමු කෙරේ. සමාලෝචිත වර්ෂය අවසානයේ ශුද්ධ වත්කම් රු.446,712,212 ක ඍණ අගයක් පෙන්වන අතර 2022 ජනවාරි 01 දිනට රු. 931,669,314 ක් වූ රදවාගත්ආදායම් ඍණ ශේෂය සමාලෝචිත වර්ෂයේ අලාභය රු.380,702,801 ක් සහ වර්ෂය තුළදී සිදුකරන ලද පෙර වර්ෂ ගැලපුම් සිදුකිරීමෙන් පසුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.1,163,063,864 ක ඍණ වටිනාකමක් දක්වා පිරිහී තිබුණි. තවද 2021 වර්ෂයේ රු.715,004,435 ක් වූ ඍණ කාරක ප්‍රාග්ධන තත්ත්වය සමාලෝචිත වර්ෂයේ දී රු.1,087,098,816 දක්වා තවදුරටත් පිරිහී තිබුණි. මෙම කරුණ නිසා මාගේ මතය තත්වාගණනය කරනු නොලැබේ.

1.4. රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මුද්‍රණ සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.5. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, රාජ්‍ය මුදල් සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

රාජ්‍ය මුදල් සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාව වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.6. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්ථාවේ 1.2 ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණයන්ට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා රාජ්‍ය මුද්‍රණ සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, ශ්‍රී ලංකා මුද්‍රණ සංථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ශ්‍රී ලංකා මුද්‍රණ සංස්ථාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයෙන් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව

2.2.2. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ). අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව හුදු ලිපියකින් පමණක් සංස්ථාවේ සභාපතිවරයා විසින් ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා මුද්‍රණය කරනු ලබන එක් ලොතරැයි පතකින් සංස්ථාවට ලැබීමට නියමිත මුදල ශත 49 සිට ශත 44 දක්වා අඩු කිරීම නිසා 2021 වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.11,899,603 හා රු.7,228,985 ක් ලෙස එකතුව රු.19,128,588 ක ආදායමක් සංස්ථාවට අහිමි වී තිබුණි.

(ආ). සංස්ථාවේ මූලික ආදායම් ප්‍රභවයක් ලෙස ජාතික ලොතරැයි මණ්ඩලයේ ලොතරයිපත් මුද්‍රණය තුලින් ලැබෙන ආදායම හඳුනාගත හැකි අතර සමාලෝචිත වර්ෂයේ එහි දායකත්වය රු.405,863,648 කි. නමුත් සමාලෝචිත වර්ෂයේ ජාතික ලොතැරැයි මණ්ඩලය දඩ හා ප්‍රමාද ගාස්තු ලෙස රු.20,072,300 අයකර ගෙන තිබුණි. එම දඩ හා ප්‍රමාද ගාස්තු ප්‍රමාණය මුළු ලොතරැයි ආදායමින් සියයට පහක ප්‍රමාණයකි. තවද සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව මුද්‍රණය කරන ජාතික ලොතැරැයි මණ්ඩලයේ ලොතරැයිපත් දෙකෙන් එක් ලොතරැයිපතක් සංස්ථාවෙන් ඉවත් කර වෙනත් ආයතයනයකට ලබා දී ඇති බවට නිරීක්ෂණය විය.

(ඇ). සංස්ථාවේ නාරම්මල අලෙවිසැලේ එක් කාමරයක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන 2020 වර්ෂයෙන් පසු වසා දමා තිබුණි. මෙම කාමරය සඳහා 2021 හා සමාලෝචිත වර්ෂයේ දී රු.312,000 ක කුළියක් නාරම්මල ප්‍රදේශීය සභාවට ගෙවා තිබුණි.

(ඇ). සංස්ථාවේ සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී 2019 හා ඊට පෙර වර්ෂයන් වලට අදාල ණයගැති ශේෂය රු.176,740,812 ක් විය. සංස්ථාව සමාලෝචිත වර්ෂයේදි මෙම ණය මුදලින් රු.1,252,517 ක් පමණක් නිරවුල් කර ඇති අතර එය 2019 හා ඊට පෙර වර්ෂ වල ණය ශේෂයන්ගෙන් සියයට 0.7ක ප්‍රමාණයක් විය.

(ඉ). සමාලෝචිත වර්ෂයට පෙර සංස්ථාවට අයත් අලෙවිසැල් පහක් වසා දමා ඇති අතර එම අලෙවිසැල් වලින් ගණුදෙනු කල රු.37,199,768 වටිනා ණයගැති ශේෂයන් සමාලෝචිත වර්ෂය ආරම්භයේ නිරූපනය වූ අතර ඉන් සමාලෝචිත වර්ෂයේදි නිරවුල් කර ගෙන ඇත්තේ රු.670,173 ප්‍රමාණයකි. එය අය වීමට ඇති මුළු ණය ප්‍රමාණයෙන් සියයට 1.8 ප්‍රමාණයකි.

(ඊ). 2020 වර්ෂයේ සිට ශේෂයන් වෙනස් වීමකින් තොරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු ශේෂය රු.109,467,898 වන අතර එය සමාලෝචිත වර්ෂය වන විටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ). සමාලෝචිත වර්ෂයේ එකතුකළ අගය මත බදු වගකීම රු.26,641,688 ක් වන අතර එය නිරවුල් කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඌ). සංස්ථාව විසින් මහජන බැංකුවේ නුගේගොඩ ශාඛාවේ තැන්පත් කර තිබූ රු.25,000,000 ක ස්ථාවර තැන්පතුව කල්පිරීමට දින 27කට පෙර නැවත ඉහල පොලි අනුපාතයක් යටතේ අලුත් කිරීමට කටයුතු කර තිබුනද එම දින 27ට අදාලව රු.177,183 ක පොළි ආදායමක් අහිමිකරගෙන තිබුණි.

(එ). මහජන බැංකුව විසින් ලබාදුන් අනුමත බැංකු අයිරා සීමාව රු.40,000,000 වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශන අනුව බැංකු අයිරාව රු.41,090,093 ක් වීම හේතුවෙන් අනුමත සීමාව ඉක්මවා රු.1,090,093 ණය ලබාගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2022

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1. මූල්‍ය ප්‍රකාශ

1.1 තත්වාගණනය කළ මත

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මෙයට පෙර සංස්ථාව විසින් වත්කම්වල අගය ප්‍රත්‍යාගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත බාරදුන් අතර ඔවුන් විසින් ඉතා ඉහළ මුදලක් ඒ සඳහා අයකරනු ලබයි. එහෙත් සංස්ථාවේ පවත්නා මූල්‍ය අර්බුදය හේතුවෙන් ඒ සඳහා ප්‍රතිපාදන සැකසීම ඉතා දුෂ්කර කාරණයක් විය. කෙසේ වෙතත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කොට ගිණුම්වලට ගැනීම සඳහා නිසි වෘත්තීය දැනුමක් සහිත සංස්ථාව අභ්‍යන්තර කමිටුවක් පත්කොට ඔවුන්ගේ නිර්දේශ මත දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කොට සංස්ථා ගිණුම් ප්‍රකාශන මෙම වසරේ සිට ඉදිරියට සැකසීමට කටයුතු කරනු ලැබේ.

(ආ) පිළිගනිමි. 2022 වසරේ පෙන්වා දී ඇති රු. 27,951,780/- 2023 වසරේ ගිණුම් වලින් මේ වන විටත් නිවැරදි කර ඇත. ඉදිරියේදී එසේ ලැබෙන මුදල් විකුණුම් අත්තිකාරම් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු සංවිධානය කර ඇත.

(ඇ) පිළිගනිමි. 2023 වර්ෂයේ අවසන් ගිණුම්වලින් එය නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඈ) පිළිගනිමි. 2022 වසරට අපේක්ෂිත ඇස්තමේන්තු ගත පොළිය ගණනය කිරීමේදී ස්ථාවර තැන්පතුව තැබූ දිනය ලෙස 2022.06.21 තැන්පතු පතෙහි සටහන්ව ඇති බැවින් ඉදිරි මාස 06 ක් සඳහා පමණක් පොළිය ගණනය කර ඇත. එහෙත් එය මාස 07 ක් ලෙස නිවැරදි විය යුතු බැවින් 2023 වර්ෂයේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඉ) මෙය ලොතරැයිපත් මුද්‍රණයට අදාලව සිදුවන මුද්‍රණ දෝෂ සහ ලොතරැයිපත් ගිවිසුම් දිනයට භාර නොදීම නිසා අඩුකරන ලද ප්‍රමාද ගාස්තු වල වටිනාකම වේ. ප්‍රමාද දෝෂයකින් මෙය විකුණුම් පිරිවැයට එකතු වී ඇතත් එය මෙහෙයුම් පිරිවැයක් ලෙස සටහන් කළ යුතුව තිබුණි. කෙසේ වෙතත් මෙමගින් සංස්ථාවේ ශුද්ධ ලාභය / අලාභය සඳහා බලපෑමක් සිදු වී නොමැත.

(ඊ) සංස්ථාවේ ගිණුම් පොත් අනුව මෙම ශේෂයන් අයවිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් වශයෙන් සඳහන් වේ. කෙසේ වෙතත් ඒවායේ නිවැරදිතාවය නැවත තහවුරු කරගෙන වාර්තා කිරීමට කටයුතු කරමි.

03) (අ) පිළිගනිමි. 2020 සහ 2021 වසරවලදී සංස්ථාවේ සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව අදාල අඩු කිරීම් සිදු කර ඇත. නමුත් එසේ අහිමි වූ ආදායම නැවත ලබා ගැනීම සඳහා පසුව ලිඛිතව දන්වා ඇති නමුත් එය ගෙවීමට කටයුතු නොකරන ලදී.

(ආ) 2022 වර්ෂයේ පැවති ආරම්භක අර්බුධකාරී තත්වය තුල කඩදාසි ආනයනය සීමා වීම නිසා ලොතරැයි මුද්‍රණ කඩදාසි හිඟ වීම හා තීන්ත ආනයනයට බාධා පැමිණීම වැනි හේතු මත ජාතික කඩදාසි සංස්ථාවේ කඩදාසි යොදා ගනිමින් මුද්‍රණය කරන ලදී. එම කඩදාසිවල ගුණත්වය අඩුවීම මත යන්ත්‍රයෙන් උපරිම නිෂ්පාදනයක් ලබාගැනීමට නොහැකිවීම වැනි ප්‍රමාදයන් ඇති විය. ඒ තුළින් ප්‍රමාද ගාස්තු වැඩි වී ඇති අතර එය වැලැක්වීම සඳහා වර්තමානයේ ක්‍රියාමාර්ග ගෙන ඇත. ආනයනික කඩදාසි භාවිතා කිරීමෙන්, ගුණාත්මක උසස් තීන්ත භාවිතයෙන් හා අක්‍රිය වූ යන්ත්‍ර නවතා නව යන්ත්‍ර භාවිතය තුලින් මෙවැනි අලාභ යලි ඇති වීම අවම කොට ඇත.

ජාතික ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි සංස්ථාවට ලබාදුන් මෙගා පවර් ලොතරැයිය 2023 ජනවාරි මස සිට වෙනත් මුද්‍රණකරුවෙකු වෙත ඔවුන්ගේ තීරණයන්ට අනුව ඉවත් කර ගෙන ඇත. එය ටෙන්ඩර් ක්‍රමය මත ලබා නොගත් බැවින් ඔවුන්ගේ තීරණයට අනුව එකඟ වීමට සංස්ථාවට සිදුවිය. එනමුදු එය ඉවත් කිරීම නතර කිරීමට අප විසින් ජාතික ලොතරැයි මණ්ඩලය සමග සාකච්ඡා කළද ඒවා අසාර්ථක විය.

(ඇ) මෙම අලෙවිසැලෙහි කොටස් දෙකම සක්‍රීයව 2020 වර්ෂයට පෙර ක්‍රියාත්මක වූ අතර ඉහළ ආදායමක් හා ඉහළ තොග ප්‍රමාණයක් අලෙවිසැලෙහි පැවතුනි. 2020 වර්ෂයෙන් පසු කොවිඩ් තත්වය හා රටතුළ පැවති අර්බුදකාරී තත්වය නිසා අලෙවි කටයුතු දුර්වල වූ බැවින් එම පරිශ්‍රය ප්‍රයෝජනයට ගැනීම සීමා සහිත විය. නමුත් අලෙවිසැල් ආදායම මත එය පවත්වාගෙන යාම ඵලදායී නොවන බැවින් අදාල ඉහළ කාමර කොටසක් නැවත ප්‍රාදේශීය සභාව වෙත භාරදීමට කටයුතු කර ඇත.

(ඈ) රු. 176,740,812 ක් ණය ශේෂය තුල ආයතනය ආරම්භයේ සිට 2012 වර්ෂය දක්වාම ඇති රු. 106,514,023.67 ක ණය ගැති ශේෂයක්ද ඇතුලත් වේ. මෙම ශේෂයන් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සොයා ගැනීමට ඇති අපහසුතාවය හේතුවෙන් මෙම ණය ගැති ශේෂයන් නිරවුල් කිරීම ඉතා අපහසු වේ. මෙලෙස අයකර ගැනීමට අපහසු ණයගැති ශේෂයන් තෝරාගෙන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ Pe/01/2021(i) චක්‍රලේඛයේ උපදෙස් අනුව ගිණුම් වලින් ලියා හැරීමට අවශ්‍ය පියවර ඉදිරියේදී ගනු ලැබේ.

(ඉ) මෙම ණය ශේෂයන්ගේ රු. 32,961,638.27 ක මුදලක් සංඝරාජ මාවත අලෙවිසැලට අදාලව හිඟ හිටි ණය සඳහා ඉන් කොටසක් විගණන අංශය විසින් පරීක්ෂණ සිදු කර වංචාවක් සම්බන්ධව රු. මිලියන 2 කට ආසන්න මුදලක් පැමිණිලි සිදු කිරීමට කටයුතු කර ඇත. ඉතිරිය තොරතුරුවල තත්වය පදනම් කර ගෙන කපා හැරීම හෝ අයකර ගැනීමට කටයුතු කරමි.

(ඊ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට ඇති බදු මුදල් සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් මස සාකච්ඡාවක් පැවැත්වූ අතර ඒ අනුව වැට් බදු ගෙවීමට සැලසුමක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව පවතින මූල්‍ය තත්වය මත කොටස් වශයෙන් ගෙවීම් කරමින් පවතී. තවද පෙර වර්ෂ වලදී හිඟ ESC, NBT ආදී බදු ශේෂයන් කපා හැරීම සම්බන්ධව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කරමින් පවතින අතර ඉන් කොටසක් කපා හැරීමට ඔවුන් එකඟ වී ඇත. එම වාර්ථා ලද විගස එම ශේෂයන් සංස්ථා ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමු.

(උ) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙතින් ඉදිරියෙදී මුදල් ලැබීමට නියමිත අතර එම මුදල් ලද පසු සියලුම වැට්බදු මුදල් ගෙවීමට කටයුතු කරන්නෙමු. වර්තමානයේ උපයන ලාභය පෙර වර්ෂ වලට අදාලව හිඟ ණය මුදල් ගෙවීමට සිදුවීම නිසා මූල්‍යමය ගැටළුවක් පවතී. නිරවුල් කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

(ඌ) රට තුල පැවති දැඩි ආර්ථික අර්බුදය හමුවේ සංස්ථාවටද කඩදාසි සපයා ගැනීමට නොහැකි වීම නිසා මුද්‍රණ කටයුතු ද මුළුමනින්ම අඩාල විය. මෙම හේතුව නිසාත් සංස්ථාවේ පැවති අඛණ්ඩ අලාභදායීත්වය නිසාත් සංස්ථා සේවක වැටුප් ගෙවීමද අභියෝගයක්ව පැවතුණි. එබැවින් ස්ථාවර තැන්පතුව ඇපයට තබා කෙටිකාලීණ ණය මුදලක් හිටපු මුදල් කළමණාකරු (වැ.බ) අපේක්ෂා කළ මුත් මෙම තැන්පතුව කල් පිරීමට නියමිත වූ නිසා එය යළි දීර්ඝ කර ගැනීමට අවශ්‍ය විය. එබැවින් මෙහිදී යම් පාඩුවක් සිදුව ඇති නමුත් එවක පොළී අනුපාතයද ඉහළ ගොස් පැවතීම නිසා 5% ක් ව පැවති පොළී අනුපාතය 23% ක් ලබා ගත හැකි විය. මෙම හේතුව නිසා එයට අදාලව රු. 491,369/- ක අමතර පොළී මුදලක් උපයා ගැනීමට හැකි විය. මෙහිදී සිදුවූ සමස්ථ අලාභය ලෙස රු. 613,356 - 461,369 = රු. 121,987/- ක් ලෙස නිවැරදි විය යුතුය.

(එ) මහජන බැංකුවේ අයිරා පහසුකම් රු. මිලියන 40 ක් වූ අතර බැංකුව සැපයූ කෙටි කාලීණ ණය සඳහා මාසය අවසානයේ පොළිය ජංගම ගිණුම හරහා අයකිරීම නිසා මෙය තාවකාලිකව අයිරාව ඉක්මවා ගියද ඒ සඳහා මුදල් තැන්පත් කළ විගස බැංකුව විසින්ම අයකර ගනී. එය බැංකුවේ පොළී අයකිරීමේ ගණුදෙණුව සඳහා පමණක් සීමාව ඉක්මවා යනු ඇත.

2022
ANNUAL
REPORT

2022
ANNUAL
REPORT

Printed at the State Printing Corporation